C
913.548
KAR

# ක්‍රි. ව. 1 සියවසේ සිට 12 සියවස අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික කලා නිර්මාණයන්හි නිරූපිත කාන්තාව:

# සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

# THE FEMALE IN ART REPRESENTATIONS IN HISTORICAL SRI LANKA, $1^{ST}$ CENTURY A.C. TO $12^{TH}$ CENTURY :

# SOCIAL ARCHAEOLOGICAL STYDY

අමුහේන් ගොඩගේ දුල්මා නිරෝෂිනී කරුණාරත්න

**HD/ M.PHIL 02/03/297**

මාර්ගෝපදේශකත්වය මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව දර්ශනපති උපාධි පරීක්ෂණය
සඳහා ඉදිරිපත් කරන ලද ස්වාධීන නිබන්ධනය

**2004**

UNIVERSITY OF PERADENIYA
28 JUN 2010

635552

# අධ්‍යයන සාරාංශය

ශ්‍රී ලංකාවේ ඓතිහාසික මූලාශ්‍රය සහ එම මූලාශ්‍රය පරිහරණය කොට ඉතිහාසය ලියූවන් විසින් බොහෝවිට කාන්තාව ''ඉතිහාසය තුළ සඟවනු'' ලැබූහ. නමුත් පුරා කලා නිර්මාණ ඇසුරෙන් එළිදරව් වන ස්ත්‍රී භූමිකාව ගැටළු අභිමුඛ තත්වයක් තුළ සන්දර්භගතකිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් කාන්තාව ක්‍රි. ව. 1වන සියවසේ සිට 12වන සියවස අවසානය දක්වා පුරාණ ශ්‍රී ලාංකේය සමාජ වපසරිය තුළ හැසිරුණු අයුරු නිශ්චය කර ගැනීම මෙම අධ්‍යයනයෙන් සිදුවේ.

අධ්‍යනයේ ප්‍රධාන පදනම් මූලාශ්‍රය ලෙස චිත්‍ර, කැටයම් සහ මූර්ති යන කලා නිරූපණයන් හා බැඳි කලා අංග භාවිත කොට, අර්ථ නිරූපණයේදී සෙසු දේශීය සහ විදේශීය පුරාවිද්‍යා මූලාශ්‍රය, සාහිත්‍ය මූලාශ්‍රය, මෙන්ම මානවවංශ පුරාවිද්‍යාත්මක දත්ත සන්සන්දනාත්මකව උපයෝගී කර ගන්නා ලදී. දත්ත විශ්ලේශනය සහ අර්ථ නිරූපණය තුළින් විවිධ කාලයන් සහ අවකාශයන් තුළ සමාජ විචල්‍යතාවනට සාපේක්ෂව කාන්තාව පිළිබඳ සමාජ චින්තනයද විචල්‍යතාවනට බඳුන් වූ බව අධ්‍යනයේදී පසක් විය. ඉන්දියානු කලා නිර්මාණ ඍජුව අනුකරණය සහ කාන්තාව හා බැඳි සමකාලීන සංස්කෘතිකාංග හැඩගැස්වීමෙහිලා ඉන්දියානු මහා සම්ප්‍රදායේ සෙවනැල්ලද නොමදව ලැබී ඇත.

පැරණි ලක්දිව කාන්තාව ආගමික ක්‍රියාකාරකම්හි නිරතවීම, භික්ෂුණී සහ උපාසිකා ස්වරූපය, ආගමික ස්ථාන ඉදිකිරීමේ අනුග්‍රහය, ශ්‍රමය සැපයීම මෙන්ම මහා සම්ප්‍රදායේ සහ චූල සම්ප්‍රදායේ වන්දනීය චරිත බවට පාත්‍රවීම හඳුනාගත හැකිය. කලා නිර්මාණයන්ගෙන් ප්‍රභූ පැලැන්තියට සේවා සැපයීම වැනි සීමිත රැකියා නියුක්තියක් නිරූපණය වුවද සෙසු මූලාශ්‍රය මෙය වඩා පුළුල් පරාසයක් වෙත රැගෙන යයි. විනිමය මාධ්‍යයන්ද තුළට කාන්තා රූපය යොදාගැනීම සැලකිය යුතු කරුණක් බවට පත්වේ.

කලා නිර්මාණ ඉදිරිපත් කිරීමේදී පුරුෂ රූවට සාපේක්ෂව පරිමාණයෙන් සහ අවකාශ සැලසීමේදී ද්විතීයික ස්ථානයක ස්ථානගත කර ඇති බව පැහැදිළිව දක්නට ලැබේ. නිරූපිත කාන්තා චරිත සීමිත සමාජ ස්තරායනයක් නියෝජනය කලද ඒ එකිනෙකෙහි වෙනස පැහැදිළිවම පිලිබිඹු කරයි. දේශපාලන ක්‍රියාකාරකම්හිදී කාන්තාව ද්විතීයික ස්ථානයකට පත්වුවත් ඓතිහාසික මූලාශ්‍රය විඛණ්ඩනයෙන් කාන්තාවන්ගේ සාක්ෂරතාව, නිර්මාණශීලීත්වය, රසඥතාව, සංස්කෘතිකාංග විෂයෙහි දායකත්වය සහ ශිල්ප ප්‍රාගුණ්‍යතාව පිලිබඳ ප්‍රාමාණික භාවය තක්සේරු කළ හැකිය.